මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/01/01/21/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.06.30

**ජාතික අයවැය චක්‍රලේඛ අංක: 02/2025**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/පළාත් ප්‍රධාන ලේකම්වරුන්
විශේෂ වියදම් ඒකක හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**අයවැය කැඳවීම - 2026**

**2026-2030 මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව තුළ 2026 වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ**

## හැඳින්වීම

1. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 22 වැනි වගන්තියට අනුකූලව, එළැඹෙන මූල්‍ය වර්ෂයේ වියදම් ඇස්තමේන්තු පිළියෙළ කිරීම පිළිබඳ ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සහ උපදෙස් ලබා දෙමින්, 2026 වර්ෂයේ අයවැය කැඳවීමේ චක්‍රලේඛය, මෙයින් නිකුත් කරනු ලැබේ.

   මෙම චක්‍රලේඛය මඟින් පහත කරුණු පිළිබඳව සංදේශනය කෙරේ.

   - අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදුව, පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශයට පත් කරන ලද, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය
   - මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට අනුකූල වන සේ සකස් කරන ලද, 2026 වර්ෂය සඳහා වන වියදම් සීමාවන්
   - රාජ්‍ය ආයෝජන වැඩසටහන (ව්‍යාපෘති සැලැස්ම-Project Pipeline) 2026-2028
   - වියදම් ඇස්තමේන්තු සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය සහ පරිපාලනමය මාර්ගෝපදේශ

## 2026 අයවැයට අදාළ උපාය මාර්ග සහ ප්‍රමුඛතා ක්ෂේත්‍ර

2. රජය විසින් මනා අවධානයකින් යුක්තව සිදු කරන ලද ප්‍රතිසංස්කරණ සහ මහජනතාව විසින් සිදු කරන ලද අසීරු කැපකිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය, රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය සම්බන්ධයෙන් යම් තිරසාර මාවතකට අවතීර්ණ වී තිබේ. කෙසේ වෙතත්, මෙම ජයග්‍රහණයන්ගෙන් සෑහීමට පත්විය නොහැකි වන අතර ආරම්භ කර ඇති ප්‍රතිසංස්කරණ අඛණ්ඩව පවත්වාගෙන යාම සහ රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීම තවදුරටත් තීරණාත්මක වේ. එබැවින්, මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ මාවත තුළ ඉදිරියටත් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

3. මෙම පසුබිම තුළ, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 10 වැනි වගන්තියේ දක්වා ඇති රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ පුළුල් අරමුණු කෙරෙහි නිසි අවධානය යොමු කරමින් අයවැය සකස් කළ යුතු ය.

4. මේ අතරම, ශ්‍රී ලංකාවේ ආර්ථික උපාය මාර්ග, ඉහළ ආර්ථික වර්ධන මාවතක් කරා යොමු කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී. එසේ නොවන්නේ නම්, රාජ්‍ය මූල්‍ය අංශයේ ඉදිරි ප්‍රතිසංස්කරණ තිරසාර නොවනු ඇත.

5. එමෙන්ම, සමාජ විෂමතාවයන් අවම කරමින්, සමස්ත සමාජය තුළ සංවර්ධනය පිළිබඳ පුළුල් හැඟීමක් ඇති කිරීමට රජය අපේක්ෂා කරයි. සංවර්ධන ප්‍රවේශයන් සඳහා රජයේ තේමාව වන්නේ "නිෂ්පාදන ආර්ථිකයක් සහ සෑම දෙනාම ආර්ථික සංවර්ධනයට දායක කර ගැනීම" යන්නයි.

6. උක්ත කරුණු සියල්ල සහ 2026 රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය හා 2026-2030 මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව වෙත නිසි අවධානය යොමු කරමින්, 2026 වර්ෂය සඳහා අයවැය සකස් කළ යුතු ය. මෙම ලේඛන මහා භාණ්ඩාගාරයේ වෙබ් අඩවියෙන් (www.treasury.gov.lk) බාගත කර ගත හැකි ය.

## 2026 අයවැයෙහි ප්‍රමුඛතා ක්ෂේත්‍ර

7. සංවර්ධනයේ ප්‍රතිලාභ සමාජයට අත්කර දීම වේගවත් කිරීමේ මූලාරම්භයන් අතරින් ප්‍රධාන ගාමක වැඩසටහන ලෙස රජය විසින් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය තෝරාගෙන ඇත. ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත "ප්‍රජාශක්ති" ලේකම් කාර්යාලය විසින් සියලුම ග්‍රාම නිලධාරී කොට්ඨාස අයත්වන පරිදි ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන සැලැස්මක් සංවර්ධනය කර ඇති බැවින්, ග්‍රාමීය මට්ටමේ සංවර්ධන අවශ්‍යතා සම්බන්ධ කටයුතුවලදී, උක්ත ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශ දිරිමත් කෙරේ.

## 2026 වර්ෂය සඳහා වන වියදම් සීමාවන්

8. 2026 වර්ෂය සඳහා ප්‍රාථමික වියදම් සීමාව රුපියල් මිලියන 4,385,400 ක් ලෙස නියම කර ඇත. සියලුම අමාත්‍යාංශ සහ විශේෂ වියදම් ඒකකවලට අදාළවන මූලික වියදම් සීමාවන් (Base Line expenditure Ceilings) **ඇමුණුම** I හි දක්වා ඇත. වෙන් කර ඇති ප්‍රතිපාදන සීමාවන් තුළ අයවැය ඇස්තමේන්තු සකස් කරන මෙන් සියලුම වැය දරන ආයතන වෙත උපදෙස් දෙනු ලැබේ.

## සවිස්තරාත්මක අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා වන මාර්ගෝපදේශ

පහත සඳහන් රාජ්‍ය මූල්‍ය මූලධර්ම සහ සම්පත් වෙන් කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශවලට අනුකූලව සවිස්තරාත්මක අයවැය ඇස්තමේන්තු සකස් කරන ලෙස උපදෙස් දෙනු ලැබේ.

### 9. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති

i. අයවැය සම්පාදනයේ දී රාජ්‍ය මූල්‍ය රීති සහ නියමයන් (fiscal rules and anchors) බලාත්මක කිරීම අතිශයින්ම වැදගත් වේ.

ii. නව ව්‍යාපෘති තෝරා ගැනීම, රාජ්‍ය ආයෝජන වැඩසටහන තුළින් සිදු කළ යුතු අතර, එහිදී රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 40 වැනි වගන්තිය අනුව පත් කරන ලද රාජ්‍ය ආයෝජන කමිටුවේ නිර්දේශ පදනම් කරගත යුතු ය. ව්‍යාපෘති තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය මුදල් අමාත්‍යවරයා විසින් සිදු කරනු ඇත. (රාජ්‍ය ආයෝජන වැඩසටහන www.treasury.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකි ය).

iii. සම්පත් බෙදා හැරීමේදීත්, අයවැය ක්‍රියාත්මක කිරීමේදීත්, පෞද්ගලික අංශයේ වර්ධනයට සහාය සැලසෙන පරිදි, දේශීය හිඟ ගෙවීම් පියැවීම සඳහා ප්‍රමුඛත්වය ලබා යුතු ය.

iv. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති නිමකිරීම සහ වෙනත් බහු වාර්ෂික බැඳීම් නිම කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය .

v. යටිතල පහසුකම් සහ වෙනත් වත්කම්වල මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි අරමුදල් සැලසීමට වගබලා ගත යුතු ය.

vi. සෞඛ්‍ය සේවා සැපයීම, පොදු ප්‍රවාහනය, උපයෝගිතා සහ අනෙකුත් මඟී නොවන ප්‍රවාහන කාර්යයන් සඳහා හැරුණු කොට, අනෙකුත් වාහන මිල දී ගැනීම් සම්බන්ධයෙන් වන අත්හිටුවීම් තවදුරටත් එලෙසම ක්‍රියාත්මක වේ.

vii. රජය විසින් සැලකිය යුතු වියදම් දරමින් අත්පත් කරගෙන ඇති, ඌන උපයෝජිත රාජ්‍ය වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමේ හෝ ආයෝජනය කිරීමේ විභවයන් සොයා බැලිය යුතු ය.

viii. ව්‍යවස්ථාපිත අරමුදල්, බැංකු හෝ වෙනත් ප්‍රාග්ධන වෙළඳපළ උපකරණවල ආයෝජනය කිරීමට වඩා, එම අරමුදල් පිහිටුවීමේ දී අදාළ වූ නීතිවල දක්වා ඇති මූලික අරමුණුවලට අනුකූල වෙමින් ආර්ථික ප්‍රතිලාභ සැලසීම සහතික වන සේ ඒවා උපයෝජනය කළ යුතු ය.

## 10. සම්පත් වෙන් කිරීම

i. වැටුප්, නොපිය වූ අතැති බිල්පත්, බදු කුලී සහ පළාත්පාලන ආයතන බදු, විදුලිය, ජලය සහ දුරකථන බිල්පත් වැනි රජයේ ව්‍යවස්ථාපිත බැඳීම් සහ අනිවාර්ය වියදම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, පූර්ණ වශයෙන් වෙන් වන බවට වගබලා ගත යුතු ය.

ii. වීරමොං පටිපාටිය යටතේ සහ අතිරේක ප්‍රතිපාදන මඟින් ප්‍රතිපාදන මාරුකිරීම් වළක්වා ගැනීම පිණිස අත්‍යවශ්‍ය වියදම් අයිතම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කළ යුතු ය.

iii. නිම වීමට ආසන්න, ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති තුළින් සමාජයට කඩිනම් ප්‍රතිලාභ ලබා දිය හැකි බැවින්, එවැනි ව්‍යාපෘතිවලට ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය.

iv. ග්‍රාමීය මට්ටමේ සංවර්ධනය ඉහළ නැංවීමට සහ නිෂ්පාදනාභිමුඛ ආර්ථිකයක් සඳහා වන කටයුතු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය.

v. අයවැය ප්‍රතිපාදන හිඟවීම් හා රේගුවෙන් භාණ්ඩ නිදහස් කරගැනීමේ ප්‍රමාද වීම් වැළැක්වීම සඳහා බදු හා සම්බන්ධ සියලු වියදම්, ආයතනවල අයවැය තුළට ඇතුළත් කර ගැනීමට වගබලා ගත යුතු ය.

vi. අපේක්ෂිත ඵලදායී ප්‍රතිඵල අත්කර ගැනීමට හැකි වන පරිදි, පවත්නා පරිගණක පද්ධති/මෘදුකාංග භාවිතයන් සහ අදාළ උපාංග යාවත්කාලීන කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය.

vii. පවත්නා රාජ්‍ය සම්පත්වලින් අපේක්ෂිත ප්‍රතිඵල ඉහළ නැංවෙන පරිදි, ඒවා නඩත්තු කිරීම, ගුණාත්මක බව සුරැකීම හා නිසි කලට ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන්, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්, ගණන්දීමේ නිලධාරීන් සහ වගකිවයුතු නිලධාරීන් සහතික විය යුතු ය. මේ සඳහා, මාර්ග, දුම්රිය මාර්ග, රෝහල්, පාසල්, විදුලි බලාගාර, වාරිමාර්ග පද්ධති, වේලි, ජල සම්පාදන ක්‍රම, කර්මාන්ත උද්‍යාන සහ රාජ්‍ය ගොඩනැගිලි ආදී පොදු දේපළ ඇතුළු රජයේ වත්කම්වලට අදාළව මෙහෙයුම් හා නඩත්තු වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් ප්‍රමාණවත් ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු ය.

viii. බහුවාර්ෂික බැඳීම් සඳහා නිසි අවධානය යොමු කළ යුතු ය.

## 11. නව ව්‍යාපෘති තේරීම් ක්‍රමවේදය

ලබා දී ඇති මූලික වියදම් සීමාව තුළ නව ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ඇතුළත් කර නැත. එබැවින්, යෝජිත නව ව්‍යාපෘති ලැයිස්තු වෙනම ඇමුණුමකින් ඉදිරිපත් කළ යුතු ය. අයවැය ඇස්තමේන්තුවලට ඇතුළත් කිරීමට සුදුසුකම් ලබන්නේ රාජ්‍ය ආයෝජන වැඩසටහන තුළ ඇතුළත් ව්‍යාපෘති පමණි. www.treasury.gov.lk වෙබ් අඩවිය හරහා රාජ්‍ය ආයෝජන වැඩසටහන වෙත ප්‍රවේශ විය හැකි ය. තෝරා ගනු ලබන ව්‍යාපෘතීන්, සියලුම පෙර සූදානම් කොන්දේසි සපුරා ඇති බවට සහතික වීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමක් වේ. වැය දරන ආයතන විසින් ඉදිරිපත් කරන ලද යෝජනා, රාජ්‍ය ආයෝජන කමිටුව විසින් සමාලෝචනය කර, ප්‍රමුඛතා ලැයිස්තුවක් මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ඇත. රාජ්‍ය ආයෝජන කමිටුව විසින් නිර්දේශිත ව්‍යාපෘතිවලින් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලට ඇතුළත් කිරීමට සුදුසු ව්‍යාපෘති තෝරා ගැනීමේ බලය මුදල් අමාත්‍යවරයා සතු වේ.

## 2026-2028 මධ්‍ය කාලීන අයවැය රාමුව තුළ 2026 වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තු සකස් කිරීම

### 12. පුනරාවර්තන වියදම්

පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කිරීමේ දී, පහත කරුණු සලකා බැලිය යුතු ය.

### *12. i. වැටුප්*

(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 මඟින් ප්‍රකාශයට පත් කරන ලද වැටුප් සංශෝධනය හේතුවෙන් 2026 වර්ෂයේ දී වැටුප් වැඩිවීම සඳහා අවශ්‍යවන ප්‍රතිපාදන වෙනම දැක්විය යුතු ය.

(ආ) 2026 වර්ෂය ආරම්භයේ දී බඳවා ගැනීම් නියත වශයෙන්ම සිදුවන බව තහවුරු කර ඇති සහ ඊට අදාළව විභාග සහ/හෝ සම්මුඛ පරීක්ෂණ දැනටමත් පවත්වා ඇති අවස්ථාවන්හි දී හැර, නව බඳවා ගැනීම් සඳහා ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු ය. එසේ නොවන නමුත් අදාළ බලධාරීන් විසින් අනුමැතිය ලබා දී ඇති අත්‍යවශ්‍ය බඳවා ගැනීම් සඳහා වන වියදම්, 2026 වර්ෂය තුළ වීරමොං ක්‍රියාපටිපාටිය යටතේ ප්‍රතිපාදන මාරුකිරීම් සහ අතිරේක ප්‍රතිපාදන හරහා කළමනාකරණය කළ හැකි ය.

(ඇ) 2025.06.30 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව මත පදනම්ව, 2026 වර්ෂය සඳහා වැටුප්, වේතන සහ අනෙකුත් දීමනා, එක් එක් නිලධාරියා වෙනුවෙන් වෙන් වෙන්ව ගණනය කළ යුතු ය. ඒ පිළිබඳ විස්තර, **ඇමුණුම්** II හි දක්වා ඇති ආකෘතියට අනුකූලව ආයතනික මට්ටමින් සකස් කර, ඉදිරිපත් කළ යුතු ය. වැය විෂය 1503 යටතේ පුද්ගල පඩිනඩි අයවැයගත කරනු ලබන නිලධාරීන්ගේ තොරතුරු ද, ඒ ඒ ආයතනය විසින් 2025 වැටුප් සංශෝධනයට අදාළ චක්‍රලේඛය ප්‍රකාරව ඉහත සඳහන් ආකෘතියම භාවිත කරමින්, වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතු ය.

### *12. ii වෙනත් පුනරාවර්තන වියදම්*

(අ) තොග මට්ටම්, කල් ඉකුත් වීමේ දිනයන් සහ භාවිත රටා නිරීක්ෂණයට ලක් වන ශක්තිමත් ඉන්වෙන්ට්‍රි කළමනාකරණ පද්ධති (Inventory Management Systems) ක්‍රියාත්මක කිරීම දිරිගැන්වෙන පරිදි වෛද්‍ය සැපයුම් ඇතුළු සැපයුම් අයවැය සැකසිය යුතු ය. එයට අමතරව, ප්‍රශස්ත භාණ්ඩ තොග මට්ටම් පවත්වා ගැනීම, පමණ ඉක්මවා ගබඩා කිරීම් සහ නාස්තිය වැළැක්වීම පිණිස නිරන්තර තොග විගණනයන් පැවැත්විය යුතු ය.

(ආ) ඉන්ධන සම්බන්ධයෙන් වන අයවැයකරණය, 2025.07.01 දිනට ඉන්ධන මිල මත පදනම්ව සිදු විය යුතු ය.

(ඇ) වෙනත් සැපයුම් (1205) සහ වෙනත් සේවා (1409) යටතේ ප්‍රතිපාදන වෙන් කිරීම් රුපියල් මිලියන 100 ඉක්මවන අවස්ථාවලදී, රුපියල් මිලියන 50 ඉක්මවන තනි වියදම් සංරචක අයිතමගත කළ යුතු ය. තනි සංරචකයක් රුපියල් මිලියන 50 නොඉක්මවන්නේ නම්, අයිතමගත කිරීම අවශ්‍ය නොවේ.

### 13. ප්‍රාග්ධන වියදම්

දැනට සිදු කර ගෙන යන සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම, රාජ්‍ය ආයෝජන වැඩසටහන මත පදනම්ව සිදු විය යුතු අතර එය අමාත්‍යාංශ සඳහා නියම කර ඇති ඇති වියදම් සීමාව තුළ පවත්වාගත යුතු ය.

## 13. i සංවර්ධන වියදම්

(අ) ප්‍රාග්ධන වියදම් උපයෝජනය අවම වීම, මහත් ගැටළුකාරී තත්ත්වයක් බවට රජය විසින් හඳුනාගෙන ඇත. එමඟින් ආර්ථික වර්ධනයට බාධා ඇති වන අතර නියමිත කාලය තුළ හා ඇස්තමේන්තුගත පිරිවැය තුළ මහජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා දීම ප්‍රමාද වේ. ඉකුත් වර්ෂයේ අයවැය කෑදවීමේ චක්‍රලේඛය මඟින් ද අවධාරණය කළ පරිදි, සමස්ත පිරිවැය ඇස්තමේන්තු සාපේක්ෂව අඩු අගයක් ගන්නා සහ අවම සංකීර්ණතාවයකින් යුතු ව්‍යාපෘති සැලකිය යුතු සංඛ්‍යාවක් ද අඩු ප්‍රගතියක් සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් පෙන්නුම් කර ඇත. එබැවින්, ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට ප්‍රථම, ව්‍යාපෘතිවල පෙර සූදානම සහ ආයතනික ධාරිතාව කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමටත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමටත්, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ අවධානය යොමු විය යුතු ය. එසේම, එවැනි ව්‍යාපෘති සම්බන්ධයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතිවල විෂයපථය නැවත නිර්ණය කිරීම (re-scoping) , රාජ්‍ය ආයෝජන සැලැස්ම තුළ ප්‍රමුඛතාවය අඩු කිරීම (moving down in the pipe-line) හෝ ඉන් ඉවත් කිරීම නිර්දේශ කරනු ලැබේ.

(ආ) තෝරාගත් නව ව්‍යාපෘති සඳහා වෙනම ඇමුණුමක් ඉදිරිපත් කළ යුතු ය. රාජ්‍ය ආයෝජන වැඩසටහනට ඇතුළත් කර ඇත්නම් මිස කිසිදු නව ව්‍යාපෘතියක් තෝරාගනු නොලැබේ. පැහැදිලි තහවුරුකිරීම් මඟින් ව්‍යාපෘති සූදානම සාධාරණීකරණය කළ යුතු ය. අමාත්‍යාංශ විසින් යෝජනා කරනු ලබන නව ආයෝජන ව්‍යාපෘති, රාජ්‍ය ආයෝජන කමිටුවේ විසින් සුපරීක්ෂණයට ලක් කර ප්‍රමුඛතාගත කරන අතර නව ව්‍යාපෘති සම්බන්ධයෙන් අවසාන තේරීම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධානවලට අනුකූලව මුදල් අමාත්‍යවරයා විසින් සිදු කරනු ඇත.

(ඇ) සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කිරීමේ දී, ඒ ඒ ප්‍රාග්ධන උප-ව්‍යාපෘතිය සඳහා වන ප්‍රතිපාදන, සම්මත ගිණුම්කරණ රාමුව තුළ (Chart of Account), සම්මත වැය විෂයන්ට අනුව වෙන් වෙන්ව බෙදා දැක්විය යුතු ය. නිදසුනක් ලෙස යම් ව්‍යාපෘතියකින් ගොඩනැඟිලි ඉදිකිරීම්, යන්ත්‍රෝපකරණ මිළ දී ගැනීම්, මෘදුකාංග සංවර්ධනය ආදිය සඳහා වැය දරන්නේ නම්, ඊට අදාළ වන පරිදි සම්මත වැය විෂයන් යටතේ ප්‍රතිපාදන වෙන් කළ යුතු ය.

(ඈ) නිශ්චිතව දක්වා ඇත්තේ නම් මිස, කිසිදු අයවැය යෝජනාවක් අදාළ වර්ෂයෙන් ඔබ්බට ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු ය.

(ඉ) ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර, රාජ්‍ය ආයෝජන වැඩසටහනට ඇතුළත් කර නොමැත්තේ නම්, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින වාර්ෂික සංවර්ධන ව්‍යාපෘති සඳහා සාමූහික ප්‍රතිපාදන වෙන් කිරීම සලකා බලනු නොලැබේ.

(ඊ) "රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම" සඳහා 2024.08.05 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය ප්‍රකාරව, දැනට පවතින තොරතුරු පද්ධති යාවත්කාලීන කිරීම පිළිබඳව විශේෂ අවධානය යොමු කරන අතරම දත්ත හුවමාරු කරගැනීම/පද්ධති ඒකාබද්ධකරණය තුළින් වඩාත් ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා පහසුකම් සැලසීම උදෙසා සුදුසු පුද්ගලයන් සහ ආයතන අනන්‍ය ලෙස හඳුනාගැනීමට හැකි වන පරිදි අනාගත තොරතුරු පද්ධති සැලසුම් කළ යුතු ය.

(උ) ඇතැම් ව්‍යවස්ථාපිත අරමුදල්, ඒවා ස්ථාපිත කරන ලද අරමුණු සඳහා උපයෝජනය නොකර, නිෂ්ක්‍රීය තැන්පතු ලෙස පවත්වාගෙන යන බව නිරීක්ෂණය වී ඇත. එවැනි පිළිවෙත් නතර කළ යුතු ය. මෙම පසුබිම තුළ, අදාළ අරමුදල් ඇති කිරීමේ අරමුණු හා නීතිමය නියමයන්ට (legal mandate) අනුකූල වන පරිදි, ජාතික ආර්ථික ප්‍රමුඛතාවන්ට අර්ථවත් ලෙස දායක වන සංවර්ධන-නැඹුරුවක් සහිත ව්‍යාපෘති සඳහා යෝජනා සකස් කළ යුතු ය.

### 13.ii ආයතනික මූලධන වියදම්

(අ) ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2021 මඟින් අවුරා තබා ඇති වාහන මිල දී ගැනීම් සම්බන්ධයෙන් වන අත්හිටුවීම් තවදුරටත් එලෙසම බලාත්මකව වේ. කෙසේ වෙතත්, සෞඛ්‍ය සේවා සැපයීම, පොදු ප්‍රවාහනය, උපයෝගිතා සහ අනෙකුත් මඟී නොවන ප්‍රවාහන අරමුණු සඳහා වන වාහන මිල දී ගැනීම්, අවස්ථාවෝචිතව සලකා බලනු ඇත.

(ආ) ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් සිදු කළ යුතු විදේශීය පුහුණු වැඩසටහන් සඳහා හැකියා වර්ධනය (වැය විෂය අංක 2401) යටතේ ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු ය. එවැනි පුහුණු අවශ්‍යතා, අතථ්‍ය ක්‍රමවේද (virtual methods) සහ දේශීය ආයතන හරහා සපුරාගත යුතු ය.

(ඇ) දේශීය පුහුණුවීම් සඳහා ප්‍රතිපාදන ඇතුළත් කළ යුත්තේ එම පුහුණුවීම්, විශේෂිත වූ කාර්යයන් කළමනාකරණය කරගැනීම සඳහා අත්‍යාවශ්‍ය වීම, සේවා ව්‍යවස්ථා, බඳවාගැනීම් පටිපාටි සහ චක්‍රලේඛ විධිවිධාන මඟින් නියම කර තිබීම හෝ අදාළ නිලධාරියාගේ රාජකාරිය සඳහා සෘජුවම අදාළ වීම යන අවස්ථාවන්හි දී පමණි.

### 13.iii නඩත්තු කිරීම්, පුනරුත්ථාපනය කිරීම් සහ වැඩි දියුණු කිරීම්

පවතින වත්කම්වලින් උපරිම ප්‍රයෝජනය ගනිමින්, ඒවායේ තිරසරභාවය සහතික කිරීම පිණිස, එම වත්කම් නඩත්තු කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි වෙන් කිරීම කෙරෙහි නිසි අවධානයක් යොමු කළ යුතු ය. ඒ අනුව, මූලධන ඇස්තමේන්තු සකස් කිරීමේ දී, පවතින වත්කම් ආරක්ෂා කර ගැනීම සහ උපරිම ඵලදායීතාවයක් අත්කරගැනීම කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය.

විශේෂයෙන් මහාමාර්ග, දුම්රිය මාර්ග, රෝහල්, පාසල්, ප්‍රධාන වේලි හා ජලාශ, වැව් අමුණු හා ඇල මාර්ග නඩත්තුව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නිශ්චිතව සඳහන් කර වෙන්කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.

### 13.iv රාජ්‍ය මූල්‍ය විමධ්‍යගතකරණය

පළාත් සභා වෙත සෘජුව පැවරී ඇති කාර්යයන් සඳහා රේඛීය අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු යටතේ ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු ය. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ප්‍රාදේශීය මට්ටමින් සිදුකරනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘති, පළාත් සභා වැඩසටහන් සමඟ ද්විකරණය වීම වැළැක්වීම පිණිස ඒවා සම්බන්ධයෙන් අදාළ පළාත් සභා සමඟ සම්බන්ධීකරණය වී සැලසුම් සකස් කරගත යුතු ය.

## අත්තිකාරම් ගිණුම් කටයුතු

**14.** රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධ ඇස්තමේන්තු **ඇමුණුම** III මඟින් ලබා දී ඇති ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතු ය. වාණිජ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන යනු ලබන ආයතන විසින් ඒ සම්බන්ධයෙන් වන ඇස්තමේන්තු, ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් වන පරිදි, සුදුසු ආකෘතියකින් ඉදිරිපත් කළ යුතු ය.

## සියලුම වැය දරන ආයතන සඳහා පොදු කරුණු

### 15. දේශගුණික විපර්යාස පිළිබඳ ප්‍රතිචාරාත්මකභාවය

දේශගුණික විපර්යාසවල බලපෑම, රාජ්‍ය මූල්‍ය විෂයෙහිලා තීරණාත්මක වන බැවින්, අයවැය තුළ, දේශගුණික විපර්යාස හා සබැඳි වියදම් සඳහා ගැලපීම් කිරීමක් (climate tagging) හඳුන්වා දීමට තීරණය කර ඇත. ඒ අනුව, දේශගුණික අවදානම අඩු කිරීම, ආපදාවලට ප්‍රතිචාර දැක්වීම, ආපදා අවම කිරීම, අනුවර්තනය වීම සහ සිදු විය හැකි දේශගුණික විපත් කළමනාකරණයට අදාළව ස්වකීය ආයතනවල ඇතුළත් වියදම් සංරචක හඳුනා

ගන්නා ලෙස වැය දරන ආයතනයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. එමෙන්ම, 2026 අයවැය සකස් කිරීමේ දී, එවැනි අවදානම් නිසි ලෙස හඳුනා ගැනීම සහ ඒවා කළමනාකරණය කිරීම සඳහා නිසි පරිදි ප්‍රතිපාදන වෙන් කිරීම කෙරෙහි ප්‍රමාණවත් තරම් අවධානයක් යොමු කළ යුතු ය. දේශගුණික බලපෑම්වලට අදාළ කටයුතු ඇතුළත් කරමින් සහ දේශගුණික බලපෑම්වලට ගොදුරු වීමේ අවදානම අඩු කරමින් රාජ්‍ය ආයෝජනවල තිරසරභාවය සහතික කිරීම සඳහා රාජ්‍ය ආයෝජන සැලසුම්කරණයේ දී දේශගුණික අවදානම් තක්සේරුකරණය සහ දේශගුණික-සුහුරු ආයෝජන ප්‍රවර්ධනය කළ හැකි ය.

එබැවින්, අයවැය ඉදිරිපත් කිරීමේ දී **ඇමුණුම IV** ද නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය. දේශගුණික විපර්යාස ආශ්‍රිත වියදම් කිසිවක් නොමැති විට, ශූන්‍ය වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

## 16. තිරසර සංවර්ධන ඉලක්ක සහ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිචාරාත්මකභාවය

තිරසාර සංවර්ධන සභා වෙබ් අඩවියෙන් (https://sdc.gov.lk/) බාගත කළ හැකි මාර්ගෝපදේශවලට අනුව, සියලුම අයවැයගත වියදම් වැඩසටහන් සහ ව්‍යාපෘති, තිරසාර සංවර්ධන ඉලක්ක සහ ආශ්‍රිත අරමුණු සමඟ පෙළගැස්විය යුතු ය. මෙම පෙළගැස්වීම තිරසාර සංවර්ධන සභාවේ තාක්ෂණික සහාය ඇතිව ඔබ ආයතනයේ නම් කර ඇති නිලධාරීන් හරහා සම්බන්ධීකරණය කළ යුතු ය. එසේ සම්පාදනය කරන ලද අයවැය තොරතුරුවල මෘදු පිටපතක්, වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට සමගාමීව ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ද පිටපතක් සහිතව info@sdc.gov.lk හරහා තිරසර සංවර්ධන සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

## 17. ස්ත්‍රී/පුරුෂ සමාජභාවය, ආබාධිතබව සහ සමාජ සමානාත්මතාව සඳහා ප්‍රතිචාර දැක්වීම

ස්ත්‍රී පුරුෂ භාවය, අබාධිතබව සහ සමාජයීය සමානාත්මතාවය කෙරෙහි ප්‍රතිචාරාත්මකභාවය සහතික වන පරිදි කටයුතු කරන ලෙස සියලුම වැය දරන ආයතන වෙත උපදෙස් දෙනු ලැබේ. එනම්, සියලුම ස්ත්‍රීන් හා පුරුෂයන්, ආබාධිත පුද්ගලයින් සහ ආදායම් කාණ්ඩ සඳහා රාජ්‍ය දේපළ හා සේවා වෙත ප්‍රවේශ වීමේ, සහභාගී වීමේ සහ ප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථා සමානව සැලසීම සහතික කළ යුතු ය. ප්‍රජනන සෞඛ්‍ය සේවා, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූලික වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන්, කාන්තාවන් ඉලක්කගත දිරිගැන්වීම් හා ආබාධිත පුද්ගලයන් සහ ඌන-වරප්‍රසාදිත ප්‍රජාවන් (marginalized communities) සවිබලගැන්වීම් ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාමාර්ග සඳහා අරමුදල් වෙන් කිරීම පිණිස විශේෂ අවධානය යොමු කළ යුතු ය.

## 18. වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

මෙම චක්‍රලේඛයේ දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම කෙරෙහි සියලුම වියදම් ආයතන විසින් ස්වකීය අවධානය යොමු කළ යුතු ය. නිසි ලෙස සම්පූර්ණ කරන ලද සියලුම ඇමුණුම් 2025 ජූලි 31 වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු ය.

ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම, ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) හරහා සිදු කළ යුතු අතර, වියදම් ඇස්තමේන්තු සඳහා 2026EXP_ES සැලසුම් පිටපත (version) ද අත්තිකාරම් ගිණුම් ඇස්තමේන්තු සඳහා 2026ADV_ES සැලසුම් පිටපත (version) ද භාවිතා කළ යුතු ය. 2026-2028 වර්ෂ සඳහා වන මධ්‍ය කාලීන අයවැය රාමුවට අනුකූල වන සේ, 2026 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සහ 2027 සහ 2028 වර්ෂ සඳහා වන පුරෝකථන අයවැය ඇස්තමේන්තු ඇතුළත් කිරීම අනිවාර්ය වේ. වියදම් ඇස්තමේන්තු සහ සියලුම අදාළ ඇමුණුම්වල දෘඪ සහ මෘදු පිටපත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ මාණ්ඩලික නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

ITMIS පද්ධතියට දත්ත ඇතුළත් කිරීම සඳහා යම් සහායක් අවශ්‍ය වන්නේ නම්, දුරකථන අංක 011-2484999 හරහා ITMIS Helpdesk නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කළ යුතු ය.

**19. ආදායම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

2026 වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ ඇතුළත් චක්‍රලේඛයක් අවශ්‍ය පරිදි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් යථා කාලයේ දී නිකුත් කරනු ඇත.

**20. අයවැය සාකච්ඡා**

වැය දරන ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන වියදම් ඇස්තමේන්තුවලට අනුව, ගැටළු හඳුනා ගැනීම, ප්‍රමුඛතා ස්ථාපනය කිරීම සහ ඇස්තමේන්තු සඳහා අවශ්‍ය වන සංශෝධන සිදු කිරීම සඳහා මහා භාණ්ඩාගාරය අදාළ ආයතන සමඟ සාකච්ඡා පවත්වනු ඇත. මෙම අයවැය සාකච්ඡා, 2025 අගෝස්තු 05 සිට 2025 සැප්තැම්බර් 04 දක්වා පැවැත්වීමට නියමිතය.

**21. පැහැදිලි කිරීම්**

මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වන්නේ නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය පිළිබඳ වගකීම දරන, විෂය භාර මාණ්ඩලික නිලධාරියා සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන්න .

**අත්.කළේ/ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත් : (i). ජනාධිපති ලේකම්
(ii). අග්‍රාමාත්‍ය ලේකම්
(iii). අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
(iv). විගණකාධිපති
(v). ලේකම්, මුදල් කොමිෂන් සභාව